# වාර්ෂික වාර්තාව 2018








NASTEC

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

## (NASTEC)

# ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව 2018

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව**

**06 මහල, D කොටස , ii අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල**

**දුරකථන අංකය: 011-2186711**

**ෆැක්ස්: 011 - 2186713**

**විද්‍යුත් ලිපිනය: info@nastec.gov.lk Web: www.nastec.gov.lk**

# පටුන

නස්ටෙක් පිළිබඳව……………………………………………………………………….4

දැක්ම හා මෙහෙවර…………………………………………………………………….4

සභාපතිනියගේ සමාලෝචනය……………………………………………………5-7

කොමිෂන් සභාවේ සාමාජිකයන්……………………………………………………8-10

සංවිධාන පැතිකඩ……………………………………………………………………….11

සංවිධාන ව්‍යුහය……………………………………………………………………...12

විද්‍යා හා තාක්ෂණ සමාලෝචනයන් හා ආයතනික සමාලෝචනයන්………………………...13

විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති අධ්‍යයන……………………………………………..17-21

ජාත්‍යන්තර සබඳතා…………………………………………………………….22-25

වෙනත් නස්ටෙක් ක්‍රියාකාරකම්………………………………………………….........26

**උපදේශක සංසද ක්‍රියාකාරකම් පිළිබඳ කාර්යසාධන අවධානයන් ....................................27**

අපගේ කාර්ය මණ්ඩලය………………………………………………………………...34

කාර්ය මණ්ඩල පුවත්……………………………………………………………………36

කාර්ය මණ්ඩලය සහභාගී වූ ඉසව්**………………………………………………………………37**

මූල්‍ය ප්‍රකාශන.........………….............................................................................38-39

විගණකාධිපති වාර්තාව…………………………………………………………...40-48

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා**
**(NASTEC)ලේකම් කාර්යාලයෙහි ප්‍රකාශනයකි.**

## නස්ටෙක් පිළිබඳව

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC) 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් ස්ථාපිත කරන ලද අතර 1998 අගෝස්තු මාසයේදී එය ක්‍රියාත්මක වීම ඇරඹිණි 19998.දෙසැම්බර් 06 දින නිල වශයෙන් ආරම්භ කරන ලද කොමිෂන් සභාව 1999 ජනවාරි මස පූර්ණ ක්‍රියාකාරී ආයතනයක් බවට පත්වූයේ ය.*

*ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්‍ෂණ කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වූ ඉහළම ආයතනය වශයෙන් නස්ටෙක් ආයතනය නම් කරනු ලැබ ඇත .කොමිෂන් සභාව සාමාජිකයන් සත් දෙනෙකුගෙන් සමන්විත වන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන් විසින් ඔවුන් පත් කරනු ලැබේ.*

## දැක්ම

***"තිරසාර සංවර්ධනය සඳහා යොදාගැනීම උදෙසා විද්‍යා හා තාක්ෂණ ජාතික හැකියාවන් ගොඩ නැංවීම සඳහා රජයට ප්‍රතිපත්ති, උපායමාර්ග හා සැලසුම් ඉදිරිපත් කිරීම"***

## මෙහෙවර

***"ශ්‍රී ලාංකීය ජනතාවගේ සමෘද්ධිය හා සෞභාග්‍යය ඉහළ නැංවීම උදෙසා විද්‍යාවේ හා තාක්‍ෂණයේ විභවය හා භාවිතය පිළිබඳ රජයට උපදෙස් සපයන විශිෂ්ට ආයතනයක් වීම"***

## සභාපතිනියගේ සමාලෝචනය



ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ (NASTEC) සභාපතිනිය වශයෙන්, 2018 වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ මෙම සමාලෝචනය නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මම මහත් සතුටට පත්වෙමි. 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතට අනුව, ආර්ථික වර්ධනය වඩාත් සක්‍රීය කිරීම සඳහා විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම; සෞඛ්‍යය පිළිබඳව හා කර්මාන්ත, කෘෂිකර්මය, සේවා සහ ආර්ථිකය සම්බන්ධයෙන් තරඟකාරීත්වය පිළිබඳ විද්‍යාව හා තාක්ෂණයේ බලපෑම; ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් සෞඛ්‍ය, පෝෂණය හා දිළිඳුකම පිටු දැකීම පිළිබඳ විද්‍යා හා තාක්ෂණයේ බලපෑම, අධ්‍යාපනය, පුහුණු හා පර්යේෂණ සඳහා වගකිව යුතු බලධාරීන්ගෙන් උපදෙස් ලබාගැනීමෙන් විද්‍යාව හා තාක්ෂණය සඳහා අවශ්‍ය වන මානව හා වෙනත් සම්පත් සංවර්ධනය; ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංවර්ධනය හා කළමනාකරණය; ජාතික වැදගත්කමක් විය යුතු විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා ප්‍රමුඛත්වයක් ලබාදීම, විද්‍යා හා තාක්ෂණ විශේෂඥතාවය පිළිබඳ වර්ධනය, රඳවා ගැනීම හා ආකර්ෂණය සඳහා යෝග්‍ය වන කාලගුණික තත්ත්වයක් ඇති කිරීම; විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ඵලදායී යොදා ගැනීම කෙරෙහි උපකාරී වන කළමනාකරණ උපාය මාර්ග ස්ථාපිත කිරීම සහ විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි පර්යේෂණ හා සංවර්ධනයට මූල්‍යයනය සඳහා ප්‍රමුඛත්වය ලබා දීම ඇතුළත්ව විද්‍යාව හා තාක්ෂණය සඳහා අරමුදල් වෙන්කිරීමට අදාළව ප්‍රතිපත්ති හා සැලසුම් ඇතුළත් විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ රජයට උපදෙස් දීම සඳහා නස්ටෙක් ආයතනයට බලය ඇත. තවද, නස්ටෙක් විසින් ශ්‍රී ලංකාවේ ඉකුත් වර්ෂයේ විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් සමාලෝචනය කර මානව සම්පත් සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳ ඵලදායීතාවය, විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි කාර්යසාධනය, විද්‍යා හා තාක්ෂණය පිළිබඳව රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳ ඵලදායීතාවය රාජ්‍ය අංශ හා පුද්ගලික අංශ ආයතන විසින් විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම පිළිබඳව වාර්තාවක් වාර්ෂිකව රජයට ඉදිරිපත් කළ යුතුය. එසේම, විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීමටත් එම ආයතනවලට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ රජයට උපදෙස් දීමට පෙර අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතන විමසා බැලීමටත් සහ අමාත්‍යතුමාගේ පූර්ව අනුමැතිය සහිතව විද්‍යා හා තාක්ෂණය පිළිබඳව ශ්‍රී ලංකා ද්වි වාර්ෂික සම්මන්ත්‍රණය කැඳවීමටත් ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පොදු වේදිකාවක් ලබාදීමටත් එම සාකච්ඡා පිළිබඳ වාර්තාවක් අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය වේ.

2018 වර්ෂය තුළදී සමකාලීන වැදගත්කමක් ඇති ප්‍රතිපත්ති තුනක් එනම් දැනුම, සේවා ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තිය, මූලික විද්‍යා පර්යේෂණ ප්‍රතිපත්තිය හා ජාතික ජෙනොම් මධ්‍යස්ථානයට සහ ජාතික

ජෙනොම් දත්ත ගබඩාවට ප්‍රවේශ වීමේ ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම සඳහා 2018 වර්ෂයේ දී කොමිෂන් සභාව ප්‍රතිපත්ති අධ්‍යයන කණ්ඩායම් තුනක් පත්කරන ලද අතර උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ සාර්ථක උපදේශකත්වය සමඟ අවසාන කෙටුම්පත් සකස් කිරීම අඛණ්ඩව සිදු කෙරුණි. කොමිෂන් සභාව විසින් එම ප්‍රතිපත්ති ලේඛන අනුමත කරන ලදී.

වර්තමාන ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය 2008 වර්ෂයේදී නස්ටෙක් විසින් සංවර්ධනය කරන ලදී. ප්‍රතිපත්ති ලේඛනය පරිපූර්ණව හා නිල වශයෙන් පිළිගනු ලැබුවද අදාළ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන විසින් එහි අන්තර්ගතය විධිමත්ව ක්‍රියාත්මක කර නොමැත. තවද ප්‍රවර්තන තත්ත්වය මත පදනම්ව ඇතුළත් කළ යුතු ක්ෂේත්‍රයන් හා කරුණු තිබෙන බව නිරීක්ෂණය විය. එබැවින්, රටේ ප්‍රවීණයන්ගේ දායකත්වයන් සමඟ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමට තීරණය කරන ලදී. මෙම කර්තව්‍ය සඳහා විශේෂ විද්වත් කමිටු 05 ක් පත් කිරීමට නස්ටෙක් කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. මෙම විද්වත් කමිටු විසින් 2017 වර්ෂයේදී සාකච්ඡා ආරම්භ කරන ලද අතර 2018 වර්ෂයේ දී මෙම ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කෙරිණි.

ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ (S&T) ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීමේදී 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතට අනුව වාර්ෂිකව නස්ටෙක් විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාව සකස් කිරීම සඳහා 2018 වර්ෂයේදී විද්‍යා හා තාක්ෂණ ආයතන 40 ක සමීක්ෂණයක් පවත්වන ලද අතර මානව හා භෞතික සම්පත් පිළිබඳ තොරතුරු රාජ්‍ය අරමුදල් වැය කිරීමේ ඵලදායීතාවය සහ 2017 වර්ෂය තුළදී කාර්යසාධනය පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලදී. පෙර වර්ෂයන්හි සකස් කරන ලද ආකෘතියට අනුව 2016 හා 2017 දෙවර්ෂයන් සඳහා විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තා 2018 වර්ෂයේ වාර්තාව සම්පාදනය සඳහා යොදා ගන්නා ලදී.

පැවරුම් නියෝගයට අනුව, 2018 වර්ෂය තුළදී විද්‍යා හා තාක්ෂණ ආයතන පහක ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා කොමිෂන් සභාව තීරණය කරන ලදී. ආයතන පහක් හඳුනාගෙන සමාලෝචන සිදු කිරීම සඳහා ප්‍රවේශ වී තිබුණද, ආයතනවලින් ස්වයං තක්සේරු වාර්තා ලබාගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ක්‍රියාවලිය ප්‍රමාද වූ අතර, සමාලෝචන තුනක් 2019 දක්වා කල් තැබීමට සිදු විය. උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ (HORDI) සමාලෝචනය සම්පූර්ණ කර ආයතනයට ඉදිරිපත් කර තිබූ අතර කඩුවෙල මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය, (GJRTI) පිළිබඳ සමාලෝචනය 2018 අවසාන කාර්තුවේදි ආරම්භ කරන ලදී.

නොබැදි හා අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල (නාම් එස් ඇන්ඩ් ටී මධ්‍යස්ථානය) විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා ශ්‍රී ලංකාවේ කේන්ද්‍රස්ථානය ලෙස නස්ටෙක් 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා විද්‍යාඥයින්ට පුහුණු අවස්ථා 11 ක් ලබා දී ඇත. මෙම වර්ෂයේදී විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමඟ හවුල් වී නස්ටෙක් විසින් 14 වන පාලක සභාවේ පළමු කාර්යාංශ රැස්වීම බොහෝ

එන්ඒඑම් (NAM) සාමාජික රටවලින් පැමිණි නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් 2018 සැප්තැම්බර් 6 සිට 7 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ කොළඹ දී සංවිධානය කරන ලදී.

2017 වර්ෂය මුලදී නස්ටෙක් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා පදනම් කරගෙන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය හා කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) විද්‍යා හා තාක්ෂණ ආයතන ප්‍රතිපත්ති සකස් කිරීම හා පර්යේෂණ හා සංවර්ධනය වාණිජකරණය (STI Policy Formulation and R&D Commercialisation) සඳහා ධාරිතා වර්ධනය පිළිබඳ වැඩමුළුවක් නස්ටෙක් විසින් සංවිධානය කරන ලදී. විද්‍යා හා තාක්ෂණ (S&T) ප්‍රතිපත්ති පර්යේෂණ පිළිබඳ ධාරිතා වර්ධනයේ ශ්‍රී ලංකාවට ආධාර කිරීම සඳහා අපේක්ෂිත STEP1 සමඟ ඒකාබද්ධ වැඩසටහන වර්ෂ 03 ක සහයෝගීත්වයකි.

නස්ටෙක් යෞවන විද්‍යාඥ සංසදයේ (Young Scientist Forum) ක්‍රියාකාරකම් කිහිපයක් බොහෝ තරුණ විද්‍යාඥයන්ගේ සහභාගීත්වයෙන් 2018 වර්ෂයේදී පැවැත්වුණි. ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව (NRDF) සඳහා යෝජනා කරන ලද පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා විශ්වවිද්‍යාල විද්වතුන් හා පර්යේෂණ ශිෂ්‍යයින් දිරිමත් කිරීම සඳහා වාර්ෂිකව උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීමට නස්ටෙක් තීරණය කරන ලදී. 2018 වර්ෂයේ 02 වන ජාතික උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය සංවිධානය කිරීම සඳහා නස්ටෙක් කොමිෂන් සභාව විසින් 2019 ඔක්තෝබර් මාසයේදී අනුමැතිය ලබා දෙන ලදී. ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව (NRDF) පිළිබඳ කේන්ද්‍රගත ක්ෂේත්‍රයන් 10 ක් යටතේ ශ්‍රී ලංකාවේ විවිධ විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ගෙන් විස්තරාත්මක නිබන්ධන 29 ක් ලැබී තිබුණි. කෙසේ වුවද, රටේ පැවතුණු වාතාවරණය හේතුවෙන් සම්මන්ත්‍රණය 2019 වර්ෂය දක්වා කල් තැබීමට සිදුවිය.

විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ද්වි වාර්ෂික සම්මන්ත්‍රණය (BICOST) 2018 නොවැම්බර් 24, 25 දිනයන්හි පැවැත්වීමට සැලසුම් කරන ලදී. තේමාගත වැඩමුළු පැවැත්වීම ඇතුළත් පූර්ව විද්‍යා හා තාක්ෂණ පිළිබඳ ද්වි වාර්ෂික සම්මන්ත්‍රණයේ (BICOST) ක්‍රියාකාරකම් සිදු කරන ලදී. කෙසේ වුවද, රටේ පැවති අවිනිශ්චිත දේශපාලන තත්ත්වය හේතුවෙන් 2018 වර්ෂයේදී BICOST සම්මන්ත්‍රණය පැවැත්වීමට නස්ටෙක් හට නොහැකි විය.

2018 වර්ෂයේ නස්ටෙක් ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සහයෝගය ලබා දෙන ලද ගරු සුසිල් ප්‍රේම ජයන්ත මැතිතුමාට හා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු ආචාර්ය සරත් අමුණුගම මැතිතුමාට ස්තුති කිරීමට කැමැත්තෙමි. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් තුමා හා අනෙකුත් නිලධාරීන්ගෙන් ලැබුණු මහත් සහයෝගය කෘතඥතා පූර්වකව පිළිගනිමි. 2018 වර්ෂය පුරා ලැබුණු සහයෝගය හා සහාය වෙනුවෙන් කොමිෂන් සභාවේ සභාපති හා අනෙකුත් සාමාජිකයන්, වැඩබලන අධ්‍යක්ෂ හා අනෙකුත් නස්ටෙක් කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තුතිය පිරිනමමි.

ඉංජිනේරු මහාචාර්ය නිරන්ජනී රත්නායක මිය

සභාපති

## කොමිෂන් සභාවේ සාමාජිකයන්

<u>**මහාචාර්ය එම්.ජේ.එස්. විජයරත්න - සභාපති**</u>



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ කැළණිය විශ්ව විද්‍යාලයේ සත්ව විද්‍යාව පිළිබඳ සභාපති

<u>දරන ලද වෙනත් තනතුරු</u>

ශ්‍රී ලංකාවේ කැළණිය විශ්ව විද්‍යාලයේ උප කුලපති; කැළණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ පීඨාධිපති

ශ්‍රී ලංකා උපකුලපති වරුන්ගේ සහ අධ්‍යක්ෂ වරුන්ගේ කමිටුවේ (CVCD)සභාපති; පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති; ශ්‍රී **ලංකා** ප්‍රමිති ආයතනය,නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය, ජාතික ධීවර හා නාවුක ඉංජිනේරු විද්‍යා ආයතනය,ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, ජාතික විද්‍යා පදනම,මූලික අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය,කාර්මික තාක්ෂණ ආයතනය සහ වයඹ පළාතේ පළාත් පරිසර අධිකාරිය යන ආයතන වල පාලක සභාවේ සාමාජික. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ මහා සභාපති, ජාතික විද්‍යා ඇකඩමියේ මහ ලේකම්, ශ්‍රී ලංකා ධීවර සහ ජලජ සම්පත් සංගමයේ හිටපු සභාපති, ශ්‍රී ලංකා ජීව විද්‍යා අධ්‍යයන ආයතනයේ සභාපති.

<u>මහාචාර්ය ආර්.ටී. කුමාරණතුංග</u>



රුහුණු විශ්වවිද්‍යාලයේ ධීවර ජෛවවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ සභාපතිනි.

<u>දරන ලද වෙනත් තනතුරු</u>

රුහුණු විශ්වවිද්‍යාලයේ ධීවර, සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ පුරෝගාමී පීඨාධිපති; රුහුණු විශ්වවිද්‍යාලයේ ධීවර ජෛවවේද අධ්‍යයනාංශයේ ප්‍රධානී; ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ මහා සභාපතිනි; ජාතික ධීවර සහ නාවුක ඉංජිනේරු ආයතනයේ සහ ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩල සාමාජිකා.

<u>මහාචාර්ය ඩී.එන්.කරුණාරත්න</u>



මහාචාර්ය, රසායන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

**දරන ලද වෙනත් තනතුරු**

කැනඩාවේ ග්වෙල්ෆ් විශ්ව විද්‍යාලයේ බාහිර මහාචාර්ය; ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ බාහිර මහාචාර්ය; කැනඩාවේ වෝටර්ලූ විශ්ව විද්‍යාලයේ බාහිර විද්‍යාඥ; ඇ.එ.ජ. කැන්සස් විශ්ව විද්‍යාලයේ පර්යේෂණ අධිසාමාජික; තායිලන්තයේ මහිදෝල් විශ්ව විද්‍යාලයේ පර්යේෂණ හවුල්කරු හා බාහිර විද්‍යාර්ථී

**<u>මහාචාර්ය ඩබ්ලිව්.එල්.සුමතිපාල</u>**



ජ්‍යෙෂ්ඨ තාක්ෂණික උපදේශක, පරිසර අමාත්‍යාංශය සහ වෙලි ආරක්ෂා ව්‍යාපෘති උපදේශක, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය, තිරසාර සංවර්ධන කමිටු සාමාජික.

**දරන ලද වෙනත් තනතුරු**

ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමේ සභාපති; භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය; පරිසර සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස අංශයේ ආරම්භක අධ්‍යක්ෂ සහ දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රධාන සාකච්ඡාකරු; දේශගුණික විපර්යාස පිළිබඳ එ.ජා. රාමු සම්මුතියේ අනුවර්තන අරමුදල් මණ්ඩල සාමාජික; පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස බලපෑම් ලිහිල් කිරීම පිළිබඳ විද්වත් කමිටු සභාපති ; පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීම පිළිබඳ විද්වත් කමිටු සාමාජික; දේශගුණික විපර්යාස පිළිබඳ එ.ජා. රාමු සම්මුතියේ පාර්ශ්ව කරුවන්ගේ සම්මේලනයට ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ ප්‍රධාන සාකච්ඡාකරු සහ ජ්‍යෙෂ්ඨ සාමාජික; පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකයේ සහ මොන්ට්‍රියල් සන්ධානයේ අධ්‍යක්ෂ; මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශ්වයන්ගේ සහ කලාපීය **ODS** නිලධාරින්ගේ විවෘත අවසානයක් සහිත ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් වලට ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ ප්‍රධානි; මොන්ට්‍රියල් සන්ධානයේ ක්‍රියාත්මක කිරීමේ කමිටුවේ සභාපති සහ විධායක කමිටු සාමාජික.

**මහාචාර්ය ගුණපාල නානායක්කාර**



අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක සහ ජාතික වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සාමාජික

**දරන ලද වෙනත් තනතුරු**

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය; සභාපති, ජාතික සමූපකාර සංවර්ධන කළමනාකරණ ආයතනය; ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව යටතේ වන සසෙක්ස් කොලෙජ් ජාලයේ ප්‍රධාන විධායක නිලධාරි; ශ්‍රී ලංකා පරිපාලන ප්‍රතිසංස්කරණ සභා සාමාජික; දකුණු ආසියානු සංවර්ධන කළමනාකරණ ආයතන සංගමයේ(AMDISA) උප සභාපති; ජාතික අධ්‍යාපන ආයතනය,ශ්‍රී ලංකා පදනම් ආයතනය, ජාතික තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ ශ්‍රී ලංකා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය යන ආයතනවල පාලක සභා සාමාජික.

**මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.එම්. ද කොස්තා**



පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ බෝග විද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ සභාපති; ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ සාමාජික

**මහාචාර්ය අර්ජුන පී. ද සිල්වා**



ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන (**SLADA**) සභාපති; වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධානි, කැළණිය විශ්ව විද්‍යාලය; උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ විශේෂඥ වෛද්‍ය; ජ්‍යරක ආන්ත්‍රිකවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල සභාපති; ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩල සාමාජික; වෛද්‍ය සභාවේ අධ්‍යයන මණ්ඩල සාමාජික; ජාතික අධ්‍යාපන ආයතනයේ සාමාජික; ජ්‍යරක ආන්ත්‍රිකවේදය පිළිබඳ පුහුණුකරු; ජ්‍යරක ආන්ත්‍රිකවේදය පිළිබඳ ලෝක ජර්නලයේ ආශ්‍රිත සංස්කාරක; ශ්‍රී ලංකා ජාතික ක්‍රීඩා සභාවේ සභා සාමාජික.


- සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධානියා වේ.

- අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරී වේ.

- ප්‍රතිපත්ති සැලසුම් සහ අනෙකුත් විද්‍යා හා තාක්ෂණ සම්බන්ධ ලේඛන සකස් කරන අධ්‍යයන කණ්ඩායම් හා උපදේශක සංසද සඳහා පහසුකම් සැලසීම සහ කළමනාකරණය කිරීම ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් හා විද්‍යාඥයින් විසින් සිදු කෙරේ.

- මූල්‍ය හා පරිපාලනය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ සියලුම මූල්‍ය හා පරිපාලන කටයුතු කළමනාකරණය කරයි.

# සංවිධාන ව්‍යුහය


ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC)
සභාපතිතුමා හා කොමිෂන් සභා සාමාජිකයෝ
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී
උපදේශකවරු
විශේෂඥ අධ්‍යයන කණ්ඩායම්
ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ - මුදල් හා පාලන
විද්‍යාඥයන්
පර්යේෂණ සහකාරවරු
තොරතුරු සන්නිවේදන තාක්ෂණ දත්ත ගබඩා සහකාර
පරිපාලන නිලධාරී
වැඩසටහන් සහකාර - මූල්‍ය
කළමනාකාර සහකාරවරු
රියැදුරන්
කාර්යාල සහායකයන්

## විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය

*රටෙහි විද්‍යා හා තාක්ෂණ තත්ත්වය පිළිබඳ වාර්ෂික ජාතික සමාලෝචනය*

ඉකුත් වර්ෂයේ රටේ විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම්වල තත්ත්වය සමාලෝචනය කර වාර්ෂිකව තත්ත්ව සමාලෝචන වාර්තාවක් රජයට සැපයීමේ වගකීම 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත (S&T ACT) මඟින් නස්ටෙක් ආයතනය වෙත පැවරී ඇත. විද්‍යා සහ තාක්ෂණ අංශයේ තීරණ ගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා රටක විද්‍යා හා තාක්ෂණ තත්ත්වය වාර්ෂිකව සමාලෝචනය කිරීම අවශ්‍ය වේ.

## විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය

රටේ විද්‍යා හා තාක්ෂණ තත්ත්වය පිළිබඳ ජාතික සමාලෝචනය පිළියෙල කිරීම සඳහා නස්ටෙක් ආයතනය විසින් 2018 වර්ෂයේදී රට තුළ ඇති විද්‍යා හා තාක්ෂණ ආයතන 40 ක ප්‍රශ්නාවලී සමීක්ෂණයක් සිදු කර 2017 වර්ෂයට අදාළව තොරතුරු ලබා ගන්නා ලදී. ලැබුණු විද්‍යා හා තාක්ෂණ දත්ත 2018 නොවැම්බර් සිට විශ්ලේෂණය කරන ලදී. පහත සඳහන් ප්‍රධාන සංරචක මෙම වාර්තාව මඟින් ආවරණය විය.

i) මානව සහ භෞතික සම්පත්.
ii) විද්‍යාව හා තාක්ෂණය වෙනුවෙන් රාජ්‍ය මුදල් වැයකිරීමේ ඵලදායීත්වය
iii) විද්‍යාව හා තාක්ෂණ ආයතන පිළිබඳ කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ පනත නස්ටෙක් වෙත බලය පවරයි.

2018 වර්ෂයේදී නස්ටෙක් විසින් විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය කිරීම සිදු කරන ලදී.

1. ගන්නෝරුව, උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (HORDI)
2. කඩුවෙල, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය (GJRTI)
3. ගන්නෝරුව, බීජ සහතික කිරීමේ සේවය
4. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව (SLIC)
5. මහ ඉලුප්පලම, ගොවි කටයුතු පර්යේෂණ මධ්‍යස්ථානය (FMRC)

ජාතියේ අවශ්‍යතාවයන් හා අපේක්ෂාවන් ඉටු කරන බවට තහවුරු කිරීම සඳහා මෙම ආයතන විසින් සිදුකරන විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම්වල ගුණාත්මක තත්ත්වය, පිරිවැය-ඵලදායීතාවය, අදාළත්වය සහ බලපෑම පිළිබඳ ඇගයීමේ අරමුණ සහිතව නස්ටෙක් විසින් පත්කරන ලද අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගෙන් සමන්විත බාහිර පාර්ශවයන් විසින් සමාලෝචනයන් සිදු කරනු ලැබේ.

## උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (HORDI)

මෙම සමාලෝචනය පහත සඳහන් විශේෂඥ මණ්ඩලය විසින් සිදු කරන ලදී.

1. මහාචාර්ය ජේ.පී.ඊශ්වර (සභාපතිනිය)
2. මහාචාර්ය ඩී.සී.කේ.ඉලේපෙරුම
3. මහාචාර්ය පාලිත වීරක්කොඩි
4. ආචාර්ය කේ.එස්.හේමචන්ද්‍ර
5. ආචාර්ය ශාන්ති විල්සන්

සමාලෝචන මණ්ඩලයේ පළමු රැස්වීම 2018 ජුනි 13 දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේදී පවත්වන ලද අතර මෙම රැස්වීමේදී සමාලෝචන සැලැස්ම සංවර්ධනය කරන ලදී. පළමු සමාලෝචන අධීක්ෂණය 2018 අගෝස්තු 16 හා 17 දිනවල සිදු කරන ලද අතර උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ (HORDI) සියලු දෙපාර්තමේන්තු සහ ගන්නොරුව ආහාර පර්යේෂණ ඒකකය සමාලෝචන මණ්ඩලය විසින් අධීක්ෂණය කරන ලදී. 2 වන සමාලෝචන අධීක්ෂණය 2018 ඔක්තෝබර් 16 දින මාකඳුර ප්‍රාදේශීය කෘෂිකර්ම හා සංවර්ධන මධ්‍යස්ථානයේදී සිදු කරන ලදී. 3 වන සමාලෝචන අධීක්ෂණය 2018 ඔක්තෝබර් 17 දින බණ්ඩාරවෙල කහගොල්ල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී සිදු කරන ලද අතර 4 වන සමාලෝචන අධීක්ෂණය 2018 ඔක්තෝබර් 18 දින නුවරඑළිය, සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී සිදු කරන ලදී.







පාර්ශවකරුවන්ගේ රැස්වීම 2018 සැප්තැම්බර් 27 දින ගන්නොරුව සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ පැවැත්වුණි. වගාකරුවන්, කෘෂි රසායන සැපයුම්කරුවන්, පුද්ගලික අංශ, සමාගම්, විද්වතුන්, ශිෂ්‍යයින්, රජයේ ආයතන, සෞඛ්‍ය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තු මෙම ඉසව්ව සඳහා සහභාගී විය. (සාකච්ඡාවෙන් පසු 2018 වර්ෂයේදී SLCARP විසින් සමාලෝචන ක්‍රියාවලිය භාරගෙන ඔවුන්ගේ සමාලෝචන ආයතනයක් ලෙස උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (HORDI) ඇතුළත් කරගන්නා ලදී) සමාලෝචන වාර්තාවේ පළමු කෙටුම්පත 2019 ජනවාරි 03 දින උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (HORDI) වෙත ඉදිරිපත් කරන ලදී.

## *මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය (GJRTI), කඩුවෙල*

2018 මැයි 25 දින මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ (GJRTI) එකඟතාවය නස්ටෙක් වෙත ලැබී තිබුණු අතර ස්වයං තක්සේරු වාර්තාව 2018 අගෝස්තු 03 දින ලැබී තිබුණි. යෝජිත සමාලෝචන මණ්ඩලය නස්ටෙක් කොමිෂන් සභාව විසින් 2018 අගෝස්තු 27 දින අනුමත කරන ලදී.

1. මහාචාර්ය පී.ජී.ආර්.ධර්මරත්න
2. ආචාර්ය එන්.පී.විජයානන්ද
3. මහාචාර්ය ආර්.එල්.ආර්.චන්ද්‍රජිත්
4. මහාචාර්ය සිරිමෙවන් කොළඹගේ
5. හර්ෂ පත්බේරිය මහතා

නස්ටෙක් විසින්,

* ගන්නෝරුව බීජ සහතික කිරීමේ සේවාව
* ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව (SLIC)
* මහඉලුප්පලම ගොවි කටයුතු පර්යේෂණ මධ්‍යස්ථානය (FMRC) හි සමාලෝචනයන් ආරම්භ කර 2019 වර්ෂයේදී සිදු කරන ලදී.

විද්‍යා හා තාක්ෂණ පනතට අනුව නස්ටෙක් හි කාර්යයන්ගෙන් එකක් වන්නේ විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ රජයට උපදෙස් දීමයි. එබැවින් 2017 වර්ෂයේදී විද්‍යා හා තාක්ෂණ අංශයේ වර්තමාන තත්ත්වයන් සහ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ප්‍රතිපත්ති තුනක් සකස් කිරීමට නස්ටෙක් ආයතනය විසින් තීරණය කරන ලදී.

ඒවා පහත පරිදි වේ.

* දැනුම සේවා ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තිය
* මූලික විද්‍යා පර්යේෂණ ප්‍රතිපත්තිය
* ජාතික ප්‍රවේණි ද්‍රව්‍ය මධ්‍යස්ථාන (National Genome Centres) හා ජාතික ප්‍රවේණි ද්‍රව්‍ය දත්ත ගබඩාව (National Genome Data Repository) කරා ප්‍රවේශ වීම වෙනුවෙන් ප්‍රතිපත්තිය

මෙම ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා මෙම ක්ෂේත්‍රවල විශේෂඥයන්ගෙන් සමන්විත අධ්‍යයන කණ්ඩායම් පත්කරන ලදී. එම එක් එක් අධ්‍යයන කණ්ඩායමේ සංයුතිය පහත පරිදි වේ.

## *<u>දැනුම සේවා ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා විශේෂඥ අධ්‍යයන කණ්ඩායම</u>*

**විශේෂඥ මණ්ඩලයේ සාමාජිකයන් වන්නේ,**

- මහාචාර්ය ඩී.ඒ.තන්ත්‍රිගොඩ
- මහාචාර්ය ඩබ්ලිව්.එල්.සුමතිපාල
- ආචාර්ය රුවන් වීරසිංහ

එම විශේෂිත ප්‍රතිපත්තිය සකස් කිරීමේදී උපදෙස් ලබාගැනීමට හෝ ශ්‍රී ලංකා සන්දර්භය සඳහා අනුකූල විය හැකි වෙනත් රටවල සකස් කරන ලද ප්‍රතිපත්ති වේ නම් යොදා ගැනීමට තීරණය කරන ලදී. එසේ කටයුතු කෙරෙන තුරු තාක්ෂණ කමිටු සාකච්ඡා නතර කර ඇත.

## *<u>මූලික විද්‍යා පර්යේෂණ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා විශේෂඥ අධ්‍යයන කණ්ඩායම</u>*

**විශේෂඥ මණ්ඩල සාමාජිකයන් වන්නේ,**

- ආචාර්ය ජී.බණ්ඩාරගේ
- මහාචාර්ය පී.ආර්.ටී.කුමාරතුංග
- මහාචාර්ය එම්.ඒ.කේ.එල්.දිසානායක
- මහාචාර්ය ඩබ්ලිව්.ඩී.ජී.ධර්මරත්න
- මහාචාර්ය එස්.එච්.පී.පී.කරුණාරත්න
- මහාචාර්ය සිරිල් විජේසුන්දර

විශ්වවිද්‍යාල හා වෙනත් විද්‍යා හා තාක්ෂණ ආයතන නියෝජනය කරමින් විශේෂඥයින් 40 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පාර්ශවකරුවන්ගේ රැස්වීම 2018 මැයි 16 දින ජාතික මූලික අධ්‍යයන ආයතනයේ (NIFS) පවත්වන ලදී. පාර්ශවකරුවන් විසින් දෙන ලද පසු විපරම ප්‍රතිපත්ති කෙටුම්පතට ඇතුළත් කරන ලදී. විශේෂඥ මණ්ඩලය කෙටුම්පත නිම කර අනුමැතිය සඳහා නස්ටෙක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අතර කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබාදෙන ලදී.

**ජාතික ප්‍රවේණි ද්‍රව්‍ය මධ්‍යස්ථානය (National Genome Centre) සහ ජාතික ප්‍රවේණි ද්‍රව්‍ය දත්ත ගබඩාව (National Genome Data Repository) කරා ප්‍රවේශ වීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමේ විශේෂඥ අධ්‍යයන කණ්ඩායම**

මෙම අධ්‍යයන කණ්ඩායම 2017 මැයි මාසයේදී පත් කරන ලදී. 2017 වර්ෂයේදී රැස්වීම් 04 ක් හා 2018 වර්ෂයේදී රැස්වීම් 03 ක් පවත්වන ලදී.

**විශේෂඥ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් වන්නේ,**

- මහාචාර්ය වජිර දිසානායක
- මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.එම්.කොස්තා
- මහාචාර්ය අතුල පෙරේරා
- මහාචාර්ය කමනී තෙන්නකෝන්
- ආචාර්ය ගාමිණී සමරසිංහ
- ආචාර්ය දර්ශන ද සිල්වා

විශ්වවිද්‍යාල හා අනෙකුත් අදාළ රජයේ හා පුද්ගලික ආයතන නියෝජනය කරමින් විශේෂඥයින් 55 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පාර්ශවකරුවන්ගේ රැස්වීම 2018 මැයි 11 දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පවත්වන ලදී. පාර්ශවකරුවන්ට ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා මාසයක කාලයක් ලබා දෙන ලදී. එම අදහස් පදනම් කරගෙන විශේෂඥ මණ්ඩලය කෙටුම්පත නිම කර අනුමැතිය සඳහා නස්ටෙක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

## *ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම*

2008 වර්ෂයේදී සකස් කරන ලද ජාතික විද්‍යා, තාක්ෂණ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමට කොමිෂන් සභාව, 2017 වර්ෂයේදී තීරණය කරන ලදී. මෙම කාර්යය සඳහා විශේෂඥ කමිටු 05 ක් පත් කරන ලදී. උප කමිටු 05 ක් විසින් ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සංශෝධනය කෙරෙමින් පවතී. පාර්ශවකරුවන්ගේ රැස්වීම පවත්වන ලද අතර පහත සඳහන් එක් එක් කමිටුව මඟින් අවසාන සංස්කරණය සිදු කෙරේ.

- ***01 වැනි විශේෂඥ කමිටුව***

1. මහාචාර්ය අර්ජුන පී ද සිල්වා - කමිටු සභාපති
2. මහාචාර්ය කේ.එම්. නලින් ද සිල්වා
3. ඉංජිනේරු ඩී.ඩී.ආනන්ද නාමල්
4. ආචාර්ය ශාන්ති විල්සන්
5. ආචාර්ය ජී.බී.ගුණවර්ධන
6. ආචාර්ය ටී.ඒ.ආර්.ජේ.ගුණසේකර

- ***02 වැනි විශේෂඥ කමිටුව***

1. මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.එම් ද කොස්තා - කමිටු සභාපති
2. මහාචාර්ය ඩී.ඒ.තන්ත්‍රිගොඩ
3. මහාචාර්ය ජයසිංහම්
4. එල්.එල්.ඩී.බන්දුසෝම මහතා
5. ඩබ්ලිව්.එන්.එන්.සතරසිංහ මිය

- ***03 වැනි විශේෂඥ කමිටුව***

1. මහාචාර්ය ගුණපාල නානායක්කාර - කමිටු සභාපති
2. මහාචාර්ය එම්.ජේ.එස්.විජයරත්න
3. මහාචාර්ය රුවිරා කුමාරතුංග
4. ආචාර්ය එන්.පී.විජයානන්ද
5. ආචාර්ය කේ.අරුලානන්ද

- ***04 වැනි විශේෂඥ කමිටුව***

1. මහාචාර්ය නීඩ්‍රා කරුණාරත්න - කමිටු සභාපතිනිය

2. මහාචාර්ය ආනන්ද ජයවර්ධන
3. මහාචාර්ය නලිනි රත්නසිරි
4. මහාචාර්ය එම්.එම්.එම්.නජීම්
5. ආචාර්ය ජෙරී ජයවර්ධන

- ***05 වැනි විශේෂඥ කමිටුව***

1. මහාචාර්ය ඩබ්ලිව්.එල්.සුමතිපාල - කමිටු සභාපති
2. මහාචාර්ය ජේ.සී.එන්.රාජේන්ද්‍ර
3. ආචාර්ය සිරිමල් ප්‍රේමකුමාර
4. ආචාර්ය තමාරා ඩයස්
5. ජී.ආර්.රණවක මිය
6. මතුගම සෙනෙවිරුවන් මහතා
7. නිල්මිණි වික්‍රමාරච්චි මිය.

# ජාත්‍යන්තර සබඳතා

## *නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල්වල විද්‍යා සහ තාක්ෂණය සඳහා මධ්‍යස්ථානය (NAM S&T CENTRE)*

නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල්වල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre, www.namstct.org), 1989 අගෝස්තු මාසයේ සිට ඉන්දියානු රජය විසින් සත්කාරකත්වය දරන ලද අන්තර්-රාජ්‍ය සංවිධානයක් වන අතර විද්‍යා හා තාක්ෂණය පිළිබඳ දකුණු-දකුණු සහයෝගීතාවය ප්‍රවර්ධනයේදී ඉතා ක්‍රියාශීලි සංවිධානයකි. ලතින් අමෙරිකානු, අප්‍රිකානු ආසියානු හා යුරෝපීය මහා ද්වීපයන් පුරා පැතිරුණු මධ්‍යස්ථානයේ සම්මානනීය සාමාජික රටවල් 47 අතුරින් එක් රටකි ශ්‍රී ලංකාව. එම සංවිධානය නොබැඳුණු සිට වෙනත් සංවර්ධනය වෙමින් පවතින රටවල් දක්වා විද්‍යාඥයින්, තාක්ෂණ විද්‍යාඥයින් සහ විද්‍යාත්මක සංවිධාන අතර අන්‍යොන්‍ය ප්‍රතිලාභ සමඟ වරප්‍රසාද සහයෝගීව සපයනු ලැබේ. මේ වන විට එම NAM S&T මධ්‍යස්ථානය විසින් කොළඹ සහ මහනුවර එවැනි ජාත්‍යන්තර අවස්ථා 7 ක් ඇතුළත්ව විවිධ සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යාත්මක හා තාක්ෂණික මාතෘකා පරාසයක් මත ජාත්‍යන්තර වැඩමුළු හා පුහුණු පාඨමාලා 110 ක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ විශාල සංඛ්‍යාවක් ඇතුළත්ව ගෝලීයව පර්යේෂකයින් හා වෘත්තිකයන් විශාල සංඛ්‍යාවකට එයින් ප්‍රතිලාභ සැලසුණි. පසුගිය 2004 සිට 2010 දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා දෙකකදී පාලක සභා කාර්යාංශ රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය සලසන ලදී.

මෙම වර්ෂයේදී විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහයෝගීත්වයෙන් නස්ටෙක් විසින් 14 වන පාලක සභාවේ පළමු කාර්යාංශ රැස්වීම ශ්‍රී ලංකාවේ කොළඹ දී 2018 සැප්තැම්බර් 06 සහ 07 දිනයන් තුළ පැවැත්වීම සඳහා සංවිධානය කරන ලදී.









## *කොරියාවේ විද්‍යා, තාක්ෂණ හා ප්‍රතිපත්ති ආයතනය* (STEPI)

2017 වර්ෂයේ මුල් කාලයේදී නස්ටෙක් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා මත පදනම්ව විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) සමඟ සහයෝගීත්වයෙන් විද්‍යා හා තාක්ෂණ ආයතන ප්‍රතිපත්ති විධිමත්ව සකස් කිරීම හා පර්යේෂණ හා සංවර්ධන වාණිජකරණය (STI Policy Formulation and R&D Commercialisation) පිළිබඳ ධාරිතා වර්ධනය සම්බන්ධයෙන් වැඩමුළුවක් නස්ටෙක් විසින් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන කොළඹ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී, විද්‍යා හා තාක්ෂණ පිළිබඳ රජයේ නියෝජිතායතන, විද්වත් ප්‍රජාව හා පර්යේෂණ ආයතනවලට අදාළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් හා කළමනාකරුවන්ගේ සහභාගීත්වයෙන් 2018 මැයි 30 සිට ජූනි 4 දක්වා කාලය තුළ, විද්‍යා හා තාක්ෂණ ආයතන (STI) ප්‍රතිපත්ති විධිමත්ව සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ මෙවලම් හා පර්යේෂණය හා සංවර්ධනය (R&D) වාණිජකරණය ක්ෂේත්‍රයන් පිළිබඳව පවත්වන ලදී.

සමස්ත වැඩසටහනේ විෂය පථය වූයේ විද්‍යා හා තාක්ෂණ ආයතන (STI) ප්‍රතිපත්ති හා පර්යේෂණ හා සංවර්ධනය වාණිජකරණය පිළිබඳ ක්ෂේත්‍රයන්හි මානව සම්පත් සංවර්ධනය මඟින් ජාතික ආර්ථික වර්ධනය සඳහා විද්‍යා හා තාක්ෂණ මෙහෙයවන කර්මාන්ත අංශයේ දායකත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනය ශක්තිමත් කිරීමයි.

**වැඩසටහන් සම සම්බන්ධීකාරකවරුන් හා කොරියන් විශේෂඥයින්**

1. ආචාර්ය හියුම් යිම් - Senior Research Fellow, KISTEP, කොරියා

2. මහාචාර්ය යන්ග්-රක් ශොයි - Senior Research Fellow, STEPI, කොරියා

3. ආචාර්ය හියුන් වූ පාක් - Senior Research Fellow, KISTI

4. ආචාර්ය ඩීඕක් ෂුන් යිම් - Senior Research Fellow, STEPI, කොරියා

**ශ්‍රී ලංකා විශේෂඥයින්**

1. ආචාර්ය පී ආර් එම් පී දිල්රුක්ෂි රණතුංග - ප්‍රධානි, ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති අංශය ජාතික විද්‍යා පදනම

2. මහාචාර්ය සිරිමෙවන් කොළඹගේ - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය






මෙම වර්ෂයේදී ප්‍රසිද්ධ කරන ලද වැඩමුළු, පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ අනුව, නස්ටෙක් විසින් එක් එක් අදාළ වැඩසටහන සඳහා පහත සඳහන් නිලධාරී නම් කිරීම් NAM S&T මධ්‍යස්ථානයට ඉදිරිපත් කරන ලදී.

| අංකය | වැඩමුළුවේ නම | රට හා කාලය | නම් කරන ලද නිලධාරීන් |
|---|---|---|---|
| 01 | තිරසාර සංවර්ධනය සඳහා තාක්ෂණික නවෝත්පාදනය හා කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව | ඉන්දියාව<br>2018 මාර්තු 27-29 | දිල්රුක්ෂි පතිරණ මිය<br>(සහකාර අධ්‍යක්ෂ අලෙවි NERDC මධ්‍යස්ථානය) |
| 02 | එන්නත් සංවර්ධනයේදී නවීන හා මතු වී එන ප්‍රවණතාවය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව | අබුජා, නයිජීරියාව 2018 මැයි 22-24 | මහේෂි අතපත්තු මිය (පර්යේෂණ විද්‍යාඥ කාර්මික තාක්ෂණ ආයතනය) |
| 03 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා විද්‍යා හා තාක්ෂණ ආයතන (STI) ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව | ක්වාලාලම්පූර් මැලේසියාව<br>2018 අගෝස්තු 6-10 | ආචාර්ය කල්ප සමරකෝන්<br>(ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ - NASTEC) |
| 04 | නිවර්තන වෙරළාශ්‍රිත සාගර පර්යේෂණ - ZMT Bremen (Germany) Fellowship – 2018 වර්ෂය සඳහා ඉල්ලුම්පත් කැඳවීම. | ජර්මනිය | කේ.පී.ජී.කනිෂ්කා පියුමි ගුරුගේ (කථිකාචාර්ය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය) |
| 05 | ක්ෂුද්‍ර ජීවීන්ට එරෙහිව ක්‍රියාකරන ප්‍රතිරෝධය සහ එය අවම කිරීම සඳහා ක්‍රමවේද පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව | ලුඩිහියානා, පන්ජාබ් ඉන්දියා<br>2018 ජුලි 10-13 | ආචාර්ය දර්ශන වික්‍රමසිංහ විශේෂඥ වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යාඥ මහ රෝහල, අම්පාර |
| 06 | විමර්ශන පදනම් විද්‍යා අධ්‍යාපන මගින් සිතීමේ නිපුණතා වර්ධනය කිරීම පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව | ක්වාලාලම්පූර් මැලේසියාව<br>2018 ඔක්තෝබර් 22-26 | ආචාර්ය ප්‍රශාන් ෆ්‍රැන්සිස් (අධ්‍යක්ෂ ජනරාල් - මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය) |
| 07 | ශාක හා සාගර ඖෂධීය ද්‍රව්‍යයන්ගෙන් ඖෂධ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව | තායි පොන්ග් වියට්නාමය 2018 දෙසැම්බර් 10-12 | ආචාර්ය නිමල් කරුණාසිරි<br>වෛද්‍ය නිලධාරී (BMARI) |
| 08 | දකුණු අප්‍රිකා විද්‍යා සංසදය | දකුණු අප්‍රිකාව 2018 දෙසැම්බර් 12-14 | ආචාර්ය ඒ.ඩී.ඒ. ද සිල්වා (අධ්‍යක්ෂ, විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය) |
| 09 | සංවර්ධනය වන රටවල සම් අංශ පිළිබඳ තිරසාරත්වය තහවුරු කිරීම සඳහා ප්‍රධාන පරාමිතීන් සංවර්ධනය කිරීම පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව | චෙන්නායි, ඉන්දියා 2019 ජනවාරි 28-31 | ආර්.ඩී.එන්.විජේසිංහ මිය (පරිවාසික කථිකාචාර්ය රුහුණු විශ්වවිද්‍යාලය) |

## වෙනත් නස්ටෙක් ක්‍රියාකාරකම්

## *02 වන ජාතික උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය (NURS) - 2018*

ප්‍රධාන කේන්ද්‍රගත ක්ෂේත්‍රයන් 10 ක් යටතේ හඳුනාගන්නා ලද ගැටලු/ ප්‍රශ්න කරා විසඳුම් සොයා ගැනීමට රටේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් යොමු කිරීම සඳහා නස්ටෙක් විසින් ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව (NRDF) සකස් කරන ලදී. පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ විශ්වවිද්‍යාල ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සහ ප්‍රමුඛතා ලෙස ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව (NRDF) හි යෝජනා කර ඇති පර්යේෂණ ක්‍රියාකාරකම් භාවිතා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුවෙහි යෝජනා කර ඇති පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සහ පර්යේෂණ සිසුන් දිරි ගැන්වීම සඳහා උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණයක් වාර්ෂිකව සංවිධානය කිරීමට නස්ටෙක් විසින් තීරණය කරන ලදී. 2018 ජූලි 09 දින පැවති රැස්වීමේදී 2018 වර්ෂයේ 2 වන ජාතික උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය සංවිධානය කිරීම සඳහා නස්ටෙක් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී තිබුණි. සම්මන්ත්‍රණය සඳහා නිබන්ධන ඉදිරිපත් කිරීම පිණිස උපාධි අපේක්ෂකයින් දිරිමත් කිරීම සඳහා ලිපියක් සමඟ සම්මන්ත්‍රණ තොරතුරු විශ්වවිද්‍යාල පීඨ හා දෙපාර්තමේන්තු 188 කට 2018 අගෝස්තු 27 දින යවන ලදී.

ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුවේ කේන්ද්‍රගත ක්ෂේත්‍රයන් 10 ක් යටතේ ශ්‍රී ලංකාවේ විවිධ විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයන්ගෙන් විස්තරාත්මක නිබන්ධන 29 ක් ලැබී තිබුණි. නිබන්ධන ඉදිරිපත් කිරීමේ අවසන් දිනය 2018 සැප්තැම්බර් 25 වූ අතර පසුව අවසන් දිනය 2018 ඔක්තෝබර් 03 දක්වා දීර්ඝ කර තිබුණි.

නිබන්ධන සමාලෝචනය සඳහා සමාලෝචන මණ්ඩලයක් තෝරාගෙන එම නිබන්ධන සමාලෝචනය සඳහා යවන ලදී. 2018 ඔක්තෝබර් 31 දින පැවැත්වීමට නියමිතව තිබූ උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය (NURS) IX විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ද්වි වාර්ෂික සම්මන්ත්‍රණයේ (BICOST IX) ක්‍රියාකාරකම් හේතුවෙන් කල් තබන ලද අතර 2019 මාර්තු මාසයේදී පැවැත්වීම සඳහා සැලසුම් කරන ලදී.

## උපදේශාත්මක සංසද ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධන අවධානයන්

## *තරුණ විද්‍යාඥ සංසදය* **(YSF)**

1999 වර්ෂයේදී හංගේරියාවේ පවත්වන ලද 21 වන සියවස වෙනුවෙන් විද්‍යාව පිළිබඳ ලෝක සම්මේලනයේදී කරන ලද යෝජනාවක ප්‍රතිඵලයක් ලෙස විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (නස්ටෙක්) විසින් ශ්‍රී ලංකා තරුණ විද්‍යාඥ සංසදය (YSF) සඳහා අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයාගේ සහ නස්ටෙක් සභාපතිවරයාගේ මෙහෙයවීමෙන් කණ්ඩායමක් මෙම සම්මන්ත්‍රණයට සහභාගී විය. තරුණ විද්‍යාඥ සංසදයේ ප්‍රධාන අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයින්ට විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීමයි. දැනට විවිධ ක්ෂේත්‍රයන්හි තරුණ විද්‍යාඥයන් 400 ඉක්ම වූ සාමාජිකත්වයකින් තරුණ විද්‍යාඥ සංසදය සමන්විත වේ.

## *තරුණ විද්‍යාඥ සංසදයේ වාර්ෂික මහා සභා රැස්වීම* **– 2018**

තරුණ විද්‍යාඥ සංසදයේ 2018 වර්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීම (AGM) 2018 ජනවාරි 19 දින ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේදී පවත්වන ලදී.

2018 වර්ෂය සඳහා තරුණ විද්‍යාඥ සංසද මෙහෙයුම් කමිටුවට පහත සඳහන් සාමාජිකයන් වාර්ෂික මහා සභා රැස්වීමේ දී පත් කරගන්නා ලදී.

***ආචාර්ය කල්ප ඩබ්ලිව් සමරකෝන් (සම්බන්ධීකාරක)***
*ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව*

***ආචාර්ය ඌෂා හෙට්ටිආරච්චි (සභාපතිනිය)***
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජෛව රසායන දෙපාර්තමේන්තුව, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය*

***ආචාර්ය ලසන්ත වීරසිංහ (සම-ලේකම්)***
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භෝග විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය*

***අකිල ජයසංක හේරත් (සම-ලේකම්)***
*කථිකාචාර්ය, ICT මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය*

***ආචාර්ය මෙත්තික විතානගේ (හිටපු සභාපති)***
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පීඨාධිපති කාර්යාලය, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය*

***ආචාර්ය සමීර සමරකෝන්***
*කථිකාචාර්ය, ජීව රසායන විද්‍යාව අණුක ජීව විද්‍යාව හා ජීව තාක්ෂණ ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය*

***ආචාර්ය උපනීත් එස් ලියනාරච්චි***

*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, නැනෝ තාක්ෂණ විද්‍යා දෙපාර්තමේන්තුව, තාක්ෂණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය*

***ආචාර්ය දිනේෂ් ආටිගල***
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ද්‍රව්‍ය විද්‍යා හා ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ඉංජිනේරු පීඨය, මොරටුව විශ්ව විද්‍යාලය*

***ආචාර්ය ජානක විජේසිංහ***
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය*

***ආචාර්ය ධර්මරාජා තිරුචරන්***
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ ප්‍රධානී, විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ඉංජිනේරු පීඨය, යාපනය විශ්ව විද්‍යාලය*

***ආචාර්ය ප්‍රසාද් ජයසූරිය***
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජෛව ක්‍රියාවලි දෙපාර්තමේන්තුව, තාක්ෂණ පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය*

***ආචාර්ය කසුන් මීගහකුඹුර***
*ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, පොල් පර්යේෂණ ආයතනය*

***ප්‍රදීප් පියතිලක***
*සන්නිවේදන හා මාධ්‍ය නිලධාරී, විද්‍යා අධ්‍යාපන හා ව්‍යාප්ති ඒකකය, මූලික අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය*

***ආචාර්ය නිරෝෂිමා විතානගේ***
*සම සෞඛ්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය*

## *තරුණ විද්‍යාඥ සංසදයේ 7 වන සම්මන්ත්‍රණය - 2018*

තරුණ විද්‍යාඥ සංසදයේ ප්‍රධාන වාර්ෂික ඉසව්ව වනුයේ තරුණ විද්‍යාඥ සංසද පර්යේෂණ සම්මන්ත්‍රණයයි. එහි 7 වන තරුණ විද්‍යාඥ සංසද පර්යේෂණ සම්මන්ත්‍රණ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේදී 2018 ජනවාරි 19 දින පවත්වන ලදී. මෙම වර්ෂයේ

සම්මන්ත්‍රණය සඳහා විස්තරාත්මක නිබන්ධන 69 ක් ලැබී තිබුණි. සංස්කරණ මණ්ඩලය විසින් පරීක්ෂා කිරීමෙන් පසුව ලේඛන සමාලෝචකයින් වෙත යවන ලදී. ද්විත්ව සමාලෝචන ක්‍රියාවලිය මඟින් (Double blind review process) විස්තරාත්මක නිබන්ධන 46 ක් තෝරාගෙන සම්මේලනයේදී ප්‍රසිද්ධ කරන ලදී.

ඉදිරිපත් කරන්නන් 40 ක් විසින් සමාන්තර සැසි 4 ක ජීව රසායන හා රසායන විද්‍යාව I සහ II, ආර්ථික විද්‍යාව හා සංඛ්‍යා ලේඛන, මානව විද්‍යාව හා සමාජ විද්‍යාව, භෞතික විද්‍යාව, ඉංජිනේරු හා තාක්ෂණ, වෛද්‍ය හා සෞඛ්‍ය විද්‍යාව, ජීව විද්‍යා හා කෘෂිකර්මය, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හා ආහාර විද්‍යාව හා පෝෂණය ඇතුළත් ඔවුන්ගේ විශිෂ්ට පර්යේෂණ සොයාගැනීම් සැසි 08 කදී සිදු කරන ලදී. සම්මන්ත්‍රණයේදී එක් එක් සැසියේ හොඳම ඉදිරිපත් කරන්නන් තිදෙනෙකුට කුසලතා සහතික ප්‍රදානය කරන ලදී.













## *තරුණ විද්‍යාඥ සම්මානය - 2017*

වාර්ෂිකව තරුණ විද්‍යාඥ සම්මාන ප්‍රදානය යළි ඇරඹීමට 2017 තරුණ විද්‍යාඥ සංසදය මෙහෙයුම් කමිටුව විසින් තීරණය කරන ලදී. මෙහෙයුම් කමිටුව විසින් පත්කරන ලද කමිටුවක් විසින් ඉල්ලුම්පත්‍ර 23 ක් සඳහා ආරම්භක පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසුව විශේෂඥ මණ්ඩලයක් විසින් පත්කරන ලද

තරුණ විද්‍යාඥ සංසද මෙහෙයුම් කමිටුව විසින් ඉල්ලුම් පත්‍ර 15 ක් ඇගයීම් කරන ලදී. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ, කෘෂිකර්ම පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය එල් ඩී.බී.සූරියගොඩ 2017 වර්ෂය සඳහා හොඳම තරුණ විද්‍යාඥයා ලෙස තේරුණු අතර 2018 ජනවාරි 19 දින ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ පැවති 07 වන තරුණ විද්‍යාඥ සංසද සම්මන්ත්‍රණයේදී සම්මානයට පාත්‍ර විය.

## කුසලතා සංවර්ධන වැඩමුළු

**1. පාසල් සිසුන් සඳහා නැනෝ තාක්ෂණ විද්‍යාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

නැනෝ තාක්ෂණ විද්‍යාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය සමඟ සහයෝගීව 2018 මැයි 23 දින කොළඹ දේවි බාලිකා විද්‍යාලයේදී පැවැත්වුණි. දැනුවත් කිරීමේ වැඩසටහනේ මූලික අරමුණ වූයේ පාසල් සිසුන් අතර නැනෝ තාක්ෂණ විද්‍යාව පිළිබඳ ස්වාධීන, තර්කානුකූල, නිර්මාණශීලී සහ විමසුම් සහගතව ප්‍රවර්ධනය කිරීම මඟින් නිර්මාණශීලී බව හා නවෝත්පාදන සංස්කෘතිය ප්‍රගුණ කරවීමයි. ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ නැනෝ තාක්ෂණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානී මහාචාර්ය සී.ඒ.එන්.ප්‍රනාන්දු සම්පත් දායක ලෙස ආරාධනය ලැබූ අතර ආරාධිත පාසල් වලින් පාසල් සිසුන් 383 ක් මේ සඳහා සහභාගී විය.






**2. විශ්ව විද්‍යාල සිසුන් හා ආචාර්යවරුන් සඳහා අණුක ජීව විද්‍යාව, සෛල ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණයේ වර්තමාන හා අනාගත ප්‍රවණතාවයන් පිළිබඳ එක් දින වැඩමුළුව**

අණුක ජීව විද්‍යාව, සෛල ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණයේ වර්තමාන හා අනාගත ප්‍රවණතාවයන් පිළිබඳ එක් දින වැඩමුළුවක් කොළඹ විශ්ව විද්‍යාලයේ IBMBB ශ්‍රවණාගාරයේ 2018 අගෝස්තු 07 දින 68 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සාර්ථකව පැවැත්වුණි.





**3. පරිසරයේ මතු වී එන විෂ ද්‍රව්‍ය: පිළියම් යෙදීම සඳහා ප්‍රභවයන් පිළිබඳ එක් දින වැඩමුළුව, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේදී**

---

“පරිසරයේ මතු වී එන විෂද්‍රව්‍ය: පිළියම් යෙදීම සඳහා ප්‍රභවයන්” පිළිබඳ එක්දින වැඩමුළුවක් තරුණ විද්‍යාඥ සංසදය විසින් සංවිධානය කර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ජල සංසදය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජෛව ගෝලය ප්‍රකෘති තත්ත්වයට පත්කිරීමේ පර්යේෂණ මධ්‍යස්ථානය (Ecosphere Resilience Research Center) සමඟ ඒකාබද්ධව 2018 ඔක්තෝබර් 03 දින කොළඹ 07, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ විමලසුරේන්ද්‍ර ශ්‍රවණාගාරයේදී පැවැත්වුණි.




**4. යාපනය විශ්වවිද්‍යාලයේදී පර්යේෂණ සඳහා සංඛ්‍යා ලේඛන පිළිබඳ දින 02 ක වැඩමුළුව**

---

තරුණ විද්‍යාඥ සංසදය විසින් යාපනය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨ සමඟ ඒකාබද්ධව පර්යේෂණ සඳහා සංඛ්‍යා ලේඛන පිළිබඳ දින 02 ක වැඩමුළුවක් පවත්වන ලදී. එය 35 දෙනෙකු ඉක්මවන ලද සහභාගීත්වයකින් 2018 නොවැම්බර් 24 හා 25 යන දෙදින තුළ යාපනය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ පරිගණක රසායනාගාරයේ සාර්ථකව පැවැත්වුණි.






## 9 වන විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ද්වි වාර්ෂික සම්මන්ත්‍රණය (BICOST IX)

නස්ටෙක් විසින් විවිධ තේමා යටතේ ද්වි වාර්ෂික සම්මන්ත්‍රණ 08 ක් පවත්වන ලදි. "තිරසාර සංවර්ධනය සඳහා විද්‍යාව, තාක්ෂණය, නවෝත්පාදනය හා වාණිජකරණය යන තේමාව" යටතේ විද්‍යාව හා තාක්ෂණය පිලිබඳ 09 වන ශ්‍රී ලංකා ද්වි වාර්ෂික සම්මන්ත්‍රණය (BICOST IX) මෙම වර්ෂයේදී සංවිධානය කරයි. යෝජනා කරන ලද තේමාව යටතේ ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය උදෙසා විද්‍යා හා තාක්ෂණ ආයතන (STI) ප්‍රතිපත්ති හා ඒවා ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග සාකච්ඡා කිරීම සඳහා විද්‍යාඥයින්, තාක්ෂණිකයින්, කර්මාන්තකරුවන්, පරිපාලකයන් හා වෙනත් පාර්ශවකරුවන් සමඟ නස්ටෙක් විසින් උපදේශන සාකච්ඡා පවත්වන ලදී. 2018 වර්ෂයේදී පිළියෙල කරන ලද ජාතික විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්ති කෙටුම්පත නස්ටෙක් විසින් 2008 වර්ෂයේදී සකස් කරන ලද ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය පදනම් වී ඇත. සියලු පාර්ශවයන්ගේ උපදෙස් ලබාගැනීමෙන් විද්‍යා හා තාක්ෂණ ආයතන පද්ධතියේ හඳුනාගත් අඩුපාඩු හා සීමා කිරීම් නිවැරදි කිරීම සඳහා කාර්ය ලේඛන පිළියෙල කිරීමට නස්ටෙක් තීරණය කරන ලදී.

කාර්ය ලේඛන පිළියෙල කිරීමේ අරමුණින් පහත සඳහන් තේමා යටතේ නස්ටෙක් ක්‍රියාකාරී කමිටු 03 ක් පත්කරන ලදී.

1. මහාචාර්ය ආනන්ද ජයවර්ධන සභාපතිත්වය දරන ලද විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදන පෛව පද්ධතිය සඳහා මාර්ග සිතියම
2. ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය සභාපතිත්වය දරන ලද පර්යේෂණ හා සංවර්ධනය වාණිජකරණය
3. මහාචාර්ය කේ.එම්.නලීන් ද සිල්වා සභාපතිත්වය දරන ලද ආයතනික සම්බන්ධීකරණය හා මානව සම්පත් සංවර්ධනය

එක් එක් කමිටුවේ නිමැවුම් කරුණු සම්පාදනය කර වාර්තාවක් 09 වන විද්‍යා හා තාක්ෂණය පිළිබඳ (BICOST IX) ශ්‍රී ලංකා ද්වි වාර්ෂික සම්මේලනයේදී අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ඇත. රටෙහි පැවතුණු කැලඹීම් ස්වභාවය හේතුවෙන් BICOST IX කල් දමා ඇති අතර එය 2019 පළමු කාර්තුවේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

## අපගේ කාර්ය මණ්ඩලය

***සභාපති,***

***ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව***

*මහාචාර්ය ඩබ්ලිව්.එල්. සුමතිපාල*

*ජ්‍යෂ්ඨ තාක්ෂණික උපදේශක, පරිසර අමාත්‍යාංශය හා වෙළි ආරක්ෂණ ව්‍යාපෘති උපදේශක, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය, තිරසාර සංවර්ධන කමිටු සාමාජික*

***වැඩබලන අධ්‍යක්ෂ***

*ඉංජිනේරු ඩී.ඩී.ආනන්ද නාමල්, B.Sc (Eng), C.Eng.M.I.E.(S.L) M.Sc (බලශක්ති තාක්ෂණය)*

***ජ්‍යෂ්ඨ විද්‍යාඥයින්***

*ආචාර්ය කල්ප සමරකෝන්, B.Sc., M.Sc. (කොළඹ), Ph.D. (JNU, කොරියාව), M.I.Biol*

*සෙයිඩ් ෂාමි, (B.Phram )(Pak),MSc (Biostat-Pera),MCPM (ශ්‍රී ලංකාව),ACAM (එක්සත් රාජධානිය)*

***නියෝජ්‍ය අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන***

*කුමාරි පීරිස් මහත්මිය, B.Com (විශේෂ-ගණකාධිකරණය)(ජයවර්ධනපුර), CBA (ICASL), APFA(ICASL)*

***විද්‍යාඥයින්***

*තිළිණි මහගමගේ මහත්මිය, B.Sc. (කැළණිය), M.Phil. (කැළණිය)*

*රසිකා පෙරේරා මහත්මිය, B.Sc. (ජයවර්ධනපුර), M.Sc. (පේරාදෙණිය)*

***පරිපාලන නිලධාරී***

*ලක්මිණි උඩුගම මෙනෙවිය, B.A(විශේෂ) සබරගමුව*

***තො.ස.තා/ දත්ත ගබඩා සහායක***

*සසින්ත සේනානායක මයා, B.Sc.(ගෞරව) Computing (විසයිඩ් විශ්ව විද්‍යාලය) (එක්සත් රාජධානිය)*

***වැඩසටහන් සහකාර/ මුදල්***

*තුසිත රත්නායක මයා, MAAT, HNDA*

***කළමනාකරණ සහකාරවරු***

*නිශාන්ති මහරගේ මහත්මිය*

*ඉෂාරා කුල්ශානි වෙදමුල්ල මහත්මිය*

*සෙව්වන්දි ප්‍රනාන්දු මහත්මිය*

*චතුරිකා සංජීවනි මහත්මිය*

*ෂෙරීන් ප්‍රනාන්දු මෙනෙවිය*

***රියදුරු***

*අනිල් කුමාර හෙට්ටිආරච්චි මයා*

*ජයශාන්ත ප්‍රභාත් මයා*

*එරන්ද ප්‍රදීප් මයා*

***කාර්යාල සහායක***

*ඒ.ඩී.ධනපාල මයා*

*කණිෂ්ක ගිම්හාන් මයා*

## කාර්ය මණ්ඩල පුවත්

- ☺ 2018 මාර්තු 09 දින නස්ටෙක් හි වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස පත් වූ ඉංජිනේරු ඩී.ඩී.ආනන්ද නාමල් නස්ටෙක් විසින් උණුසුම් ලෙස පිළිගනු ලැබීය.

- ☺ සභාපති මහාචාර්ය එම්.ජේ.එස්.විජයරත්න 2018 අප්‍රේල් 17 දින ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සේවයෙන් ඉවත් විය.

- ☺ 2018 අප්‍රේල් 19 සිට නස්ටෙක් වැඩබලන සභාපතිවරයා ලෙස මහාචාර්ය ඩබ්ලිව්.එල්.සුමතිපාල නස්ටෙක් විසින් උණුසුම් ලෙස පිළිගනු ලැබූ අතර ඔහු 2018 ජූලි 11 දින සිට සභාපති ලෙස පත්වීම් ලැබීය.

- ☺ 2018 සැප්තැම්බර් මාසයේදී සසින්ත සේනානායක මහතා තො.ස.තා/ දත්ත ගබඩා සහායක ලෙස සේවයට බැඳුණි.

- ☺ 2018 ඔක්තෝබර් මාසයේදී සෙයිඩ් ෂාමි මහතා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ලෙස සේවයට බැඳුණි.

- ☺ 2018 ඔක්තෝබර් මාසයේදී චතුරිකා සංජීවනි මහත්මිය සහ ෂෙරීන් ප්‍රනාන්දු මෙනෙවිය කළමනාකරණ සහකාරවරුන් ලෙස සේවයට බැඳුණි.

- ☺ 2018 දෙසැම්බර් මාසයේදී සෙව්වන්දි ප්‍රනාන්දු මහත්මිය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා සේවයෙන් ඉවත් වූ අතර නස්ටෙක් විසින් ඇයගේ ඉදිරි සියලු කටයුතු සාර්ථක වීම සඳහා ආශීර්වාද කරන ලදී.

# කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩසටහන්

- ☺ පරිපාලන නිලධාරිණී ලක්මිණී උඩුගම මෙනෙවිය 2018 පෙබරවාරි 19 දින ජාතික කම්කරු අධ්‍යයන ආයතනයේ පවත්වන ලද "නිලධාරී රාජකාරී හා නිවාඩු පිළිබඳ වගකීම්" පිළිබඳ වැඩමුළුවකට සහභාගී වූවාය.

- ☺ පරිපාලන නිලධාරිණී ලක්මිණී උඩුගම මෙනෙවිය 2018 මැයි 14, 21 හා 28 දිනයන්හි ජාතික කම්කරු අධ්‍යයන ආයතනයේ පවත්වන ලද "ප්‍රසම්පාදන පුහුණු" වැඩමුළුවකට සහභාගී වූවාය.

- ☺ කළමනාකරණ සහකාර ඉෂාරා කුල්ශානි මෙනෙවිය 2018 ජූනි 13 සහ 14 දිනයන්හි ජාතික කම්කරු අධ්‍යයන ආයතනයේ පවත්වන ලද "ප්‍රධාන කාර්යාල කාර්ය මණ්ඩලය හා පාරිභෝගික සේවා නිලධාරීන් සඳහා දුරකථන කුසලතා සහ චාරිත්‍ර පුහුණුව " පිළිබඳ වැඩමුළුවකට සහභාගී වූවාය.

- ☺ පරිපාලන නිලධාරී ලක්මිණී උඩුගම මෙනෙවිය 2018 නොවැම්බර් 13 දින ග්‍රෑන්ඩ් ඕරියන්ටල් හෝටලයේ පවත්වන ලද "ආයතනික කළමනාකරණය" පිළිබඳ වැඩමුළුවකට සහභාගී වූවාය.

- ☺ වැඩසටහන් සහකාර මුදල් - තුසිත රත්නායක මහතා 2018 දෙසැම්බර් 18 දින ග්‍රෑන්ඩ් ඕරියන්ටල් හෝටලයේ පවත්වන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සම්මන්ත්‍රණයකට සහභාගී වූයේය.

# මූල්‍ය ප්‍රකාශන

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**
**2018 දෙසැම්බර් 31 දිනට**
**(සියලු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)**

| | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 7,420,521 | 249,813 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු | 2 | - | 192,935 |
| ඉන්වෙන්ට්‍රි/ තොග | 3 | 100,112 | 90,835 |
| පූර්ව ගෙවීම් | 4 | 1,039,219 | 929,252 |
| සේවක ණය - කෙටිකාලීන | 5 | 205,796 | 161,710 |
| | | 8,765,648 | 1,624,545 |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල, පිරියත හා උපකරණ | 6 | 8,107,344 | 11,887,053 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 7 | 1,275,500 | 1,275,500 |
| සේවක ණය - දිගුකාලීන | 8 | 443,303 | 447,027 |
| | | 9,826,147 | 13,609,580 |
| මුළු වත්කම් | | 18,591,795 | 15,234,125 |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| උපචිත වියදම් | 9 | 7,850,423 | 5,836,906 |
| ජංගම නොවන වගකීම් | | | |
| විලම්බිත ආදායම් | 10 | 774,243 | 858,800 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 11 | 2,780,798 | 2,175,546 |
| මුළු වගකීම් | | 3,555,041 | 3,032,346 |
| | | 11,411,464 | 8,869,252 |
| මුළු ශුද්ධ වත්කම් | | 7,180,331 | 6,364,873 |
| ශුද්ධ වත්කම්/ හිමිකම් | | | |
| සමුච්චිත අරමුදල | | 1,904,910 | 1,904,910 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 9,849,258 | 13,544,410 |
| සංචිත | | (4,573,837) | (9,084,447) |
| මුළු ශුද්ධ වත්කම්/ හිමිකම් | | 7,180,331 | 6,364,843 |

**මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 01 සිට 02 දක්වා ද සටහන් පිටු අංක 07 සිට 11 දක්වා ද ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයන් වගකිව යුතු වේ. මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අනුමත කර පහත අත්සන් තබා ඇත.**

and signed on their behalf.

Chairman

Actg. Director

Deputy Director -
Finance and Administration

Member of the Commission

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**
**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**(සියලු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)**

| | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| ආදායම | | | |
| පුනරාවර්තන ප්‍රදාන | | 29,134,006 | 24,868,643 |
| මූලධන ප්‍රදාන - පර්යේෂණ හා සංවර්ධන | 12 | 13,332,325 | 4,676,825 |
| මූලධන ප්‍රදාන - ධාරිතා වර්ධනය | | 157,000 | 177,000 |
| රජයේ ප්‍රදාන ක්‍රම ක්ෂය කිරීම - ක්ෂය | | 4,359,709 | 4,482,372 |
| ආදායම | 13 | 166,078 | 186,833 |
| | | ----------------- | ---------------- |
| | | 47,149,118 | 34,391,673 |
| වියදම | | | |
| පුද්ගලික පඩිනඩි | 14 | 12,339,312 | 10,847,081 |
| ගමන් වියදම් | 15 | 752,381 | 319,395 |
| සැපයුම් හා භාවිතා කළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 16 | 683,688 | 426,140 |
| නඩත්තු | 17 | 912,966 | 859,962 |
| ගිවිසුම්ගත සේවා | 18 | 8,527,823 | 8,8169,049 |
| මාරු කිරීම් | 19 | 3,971,448 | 3,536,903 |
| ධාරිතා වර්ධනය | 20 | 218,380 | 232,797 |
| පර්යේෂණ හා සංවර්ධනය | 21 | 9,307,956 | 8,083,580 |
| රැස්වීම් වියදම් | 22 | 1,564,845 | 854,037 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 6 | 4,359,709 | 4,482,372 |
| | | ------------- | ------------- |
| මුළු වියදම් | | 42,638,508 | 38,458,316 |
| | | --------------- | --------------- |
| මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/ (ඌනතාවය) | | 4,510,610 | (4,066,643) |
| | | ======== | ========= |
| මූල්‍ය පිරිවැය | | | |
| දේපල, පිරියත හා උපකරණ මත වාසිය | | - | (73,110) |
| වාහන රක්ෂණය | | - | (2,200) |
| | | ---------------- | -------------- |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (ඌනතාවය) | | 4,510,610 | (4,141,953 |
| | | ========= | =========== |

## විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීඊසී/ඒ/එන්ඒඑස්ටීඊසී/04/03/2018
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2019 මැයි 31 දින

සභාපති,

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

4

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාවට සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 5(ආ) වගන්තිය | රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර විසින් විද්‍යාව හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචන වාර්තාවේ කටයුතු අවසන් කර නොතිබුණි. 2018 වර්ෂය සඳහා වූ වාර්තාවද මූලික අදියරෙහි පැවතුණි. |

| | |
|---|---|
| (ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2010 දෙසැම්බර් 10 දිනැති අංක 1/2010 දිනැති චක්‍රලේඛයේ (1)(ඊ) වගන්තිය | රාජ්‍ය ව්‍යවසායන්හි හා විශ්වවිද්‍යාල අනධ්‍යන කාර්ය මණ්ඩලයෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් දරන වසර 12 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විධායක නිලධාරීන් හට තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබා ගැනීමට හැකිය. එසේ වුවද කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයාගේ සේවය 2003 ජූලි 31 දින ස්ථිර කර තිබියදී ඔහු 2011 ජූනි 08 දින තීරු බදු රහිත වාහන බලපත්‍රයක් මත චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව වාහනයක් ආනයනය කර තිබුණි. එසේ වුවත් මේ සම්බන්ධව පරීක්ෂා කර බලා අවශ්‍ය පියවර ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති හා අංක PED/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය | විගණන කමිටුව මාස 03 කට එක් වරක් හෝ කැඳවිය යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2018 වර්ෂය තුලදී එක් විගණන කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ද) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**3. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක 2018 පෙබරවාරි 20 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි විද්‍යා, තාක්ෂණ හා පර්යේෂන අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු කර තිබූ අතර 2018 ජූනි 19 දිනැති කොමිෂන් සභාවේ පාලක මණ්ඩල වාර්තාව අනුව 2018 ජූලි 09 දින අනිවාර්ය නිවාඩු ලබාදී තිබුණි. එබැවින් මෙම නිලධාරියා වෙත 2018 මාර්තු 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කරන ලද රු.1,460,595 ක මුදල ආර්ථික නොවන වියදමක් බවට පත් වී තිබුණි.

(ආ) නව වන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව (Biennial Conference on Science and Technology IX) පැවැත්වීම සඳහා 2018 වර්ෂයට රු.5,628,000 ක මුදලක් වෙන්කර ගෙන තිබූ අතර එයින් රු.4,803,561 ක මුදලක් වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි. එසේ වුවත් විගණිත දින වන විටත් එම සමුළුව පැවැත්වීමට කොමිෂන් සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනික සමාලෝචනය (Institutional Reviews) යටතේ 2018 වර්ෂයේ ආයතන 6 ක් සමාලෝචනය කර ඇතත් එයින්, සහල් සම්පත් සංවර්ධන ආයතනය (Rice Research and Development Institute), ජාතික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය (National Resources Management Centre), උද්‍යාන බෝග සංවර්ධන ආයතනය (Horticultural Crop Development Institute) යන ආයතන 03 හි සමාලෝචනයන් පමණක් සම්පූර්ණයෙන් නිමකර තිබුණි.

(ඇ) විද්‍යාත්මක හා තාක්ෂණික ගැටළු පිළිබඳ වර්තමාන වැදගත්කම පිළිබඳව අධ්‍යයන කණ්ඩායම් (Study Group) විසින් 2018 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර තිබූ ප්‍රතිපත්ති වාර්තා කිරීම හා ප්‍රතිපත්ති නිර්දේශ කිරීම් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) විද්‍යා හා තාක්ෂණ අධ්‍යනය හා සම්පාදන ව්‍යාපෘති හරහා නිමකළ යුතු ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති 3 ම වර්ෂය තුළ නිමකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු**

---

විගණකාධිපති විසින් නිකුත් කරන ලද අංක ටීඊසී/ඒ/එන්ඒඑස්ටීඊසී/04/03/2018 දරන ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු හා පැහැදිලි කිරීම් පහත දැක්වේ.

2. (අ) අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතන විසින් 2017 වර්ෂය සඳහා විද්‍යා හා තාක්ෂණ සමාලෝචන වාර්තාව සඳහා තොරතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන්, අදාළ දත්ත ඇතුළත් කර හා විශ්ලේෂණය කර 2018 වර්ෂය සඳහා වාර්තාව පිළියෙල කර සම්පූර්ණ කිරීමට නොහැකි විය. 2018 වර්ෂය සඳහා සමාලෝචන වාර්තාව 2019 වර්ෂයේ අවසාන කාර්තුව අවසානයේදී සම්පූර්ණ කිරීම සඳහා සැලසුම් කර ඇත.

කොමිෂන් සභාවේ 2019 මාර්තු මාසයේදී පවත්වන ලද සමාරම්භක රැස්වීමේදී නව කොමිෂන් සභාව දත්ත එක්රැස් කිරීම හා වාර්තා පිළියෙල කිරීමේ අවශ්‍යතාවය වඩාත් කාර්යක්ෂමව සිදු කළ යුතු බව පිළිගත් අතර අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සඳහා යෝජනා සම්මත කරගන්නා ලදී.

(ආ) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ආචාර්ය මුදිත ලියනගෙදර 1999 ජනවාරි 01 දින විද්‍යාත්මක වැඩසටහන් කළමනාකරු (II ශ්‍රේණිය)ලෙස වර්ෂ දෙකක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී. ඉහත තනතුර සඳහා මෙම කොන්ත්‍රාත්තුව 2003 ජුලි 30 දක්වා වරින් වර දීර්ඝ කරන ලදී. 2003 ජුලි 31 ඉහත තනතුර සඳහා ස්ථිර පත්වීමක් ඔහු වෙත ප්‍රදානය කරන ලදී.

මේ අතරතුර, කළමනාකරණ සේවා චක්‍රලේඛ (DMS) 30 හි විධිවිධාන ප්‍රකාරව 2007.02.13 දිනට 1 ශ්‍රේණියේ MM 1 – 3 වැටුප් වර්ගය සඳහා තබන ලදී.

2013 ජුලි 01 දින AR-02 වැටුප් පරිමාණයට ඔහු ඇතුළත් කරන ලදී. මෙම තොරතුරු පහත සඳහන් වගුවේ දැක්වේ. ඔහු 2010 අගෝස්තු 01 දින වැඩ බැලීමේ පදනම මත අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කරන ලදී.

| තනතුර | සිට | දක්වා | තනතුරේ තත්ත්වය |
|---|---|---|---|
| ---------- | ------ | ---------- | ---------------------- |
| විද්‍යා වැඩසටහන් කළමනාකරු - II ශ්‍රේණිය | 1999.01.01 | 2003.07.03 | කොන්ත්‍රාත් |
| විද්‍යා වැඩසටහන් කළමනාකරු - II ශ්‍රේණිය | 2003.07.31 | 2007.02.12 | ස්ථිර |
| විද්‍යා වැඩසටහන් කළමනාකරු (MM 1-3-1 ශ්‍රේණිය | 2007.02.13 | 2013.05.30 | ස්ථිර |
| ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ AR-2 | 2013.06.01 | - | ස්ථිර |

ඒ අනුව, ඔහු විසින් 2011 ලබාගන්නා ලද වාහන බලපත්‍රය සැලකිල්ලට ගැනීමේදී, කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය සමඟ අවම වශයෙන් වර්ෂ 12 ක ක්‍රියාකාරී සේවාවක් සම්පූර්ණ කර ඇත. එහෙත් කොන්ත්‍රාත් කාලය සැලකිල්ලට නොගතහොත් අවම වර්ෂ 12 ක කාලය සම්පූර්ණ නොවේ.

2011 වර්ෂයට අදාළ අංක TTIP/01/2010(1) දරන චක්‍රලේඛයෙන් ක්‍රියාකාරී කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය සහිතව/ කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය රහිතව යන්න පැහැදිලිව දක්වා නැත.

(ඇ) වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, ආයතනයේ සේවක අර්බුදය හා සභාපති කෙනෙක් නොමැති වීම හේතුවෙන් හා වර්ෂය අවසානයේ රටේ පැවති තත්ත්වය හා අනෙකුත් නොවැළැක්විය හැකි කරුණු හේතුවෙන් විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය.

කොමිෂන් සභාවේ විගණන කමිටුවේ සාමාජිකයන් ලෙස එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මහතා (සභාපති) මහාචාර්ය ජෙනිෆර් පෙරේරා හා ප්‍රසාද් එදිරිසිංහ මහතා පත්කර තිබූ අතර 2019 මාර්තු මාසයේදී රැස්විය. 2019 ජූනි මාසයේදී කමිටුව රැස්වීමට සැලසුම් කරන ලද අතර මෙම වර්ෂයේදී තවත් විගණන කමිටු රැස්වීම් 03 ක් පවත්වනු ඇත.

## 3. වෙනත් විගණන නිරීක්ෂණ

-------------------------------

(අ) විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ අභ්‍යන්තර ගැටලු සොයා බැලීම සඳහා පත්කරන ලද සාමාජිකයන් තිදෙනෙකුගේ කමිටුව විසින් විමර්ශනයන් අඛණ්ඩව සිදු කරන අතර අධ්‍යක්ෂවරයා දීර්ඝ කාලයක් අනිවාර්ය නිවාඩු යවා තිබුණි. අනිවාර්ය නිවාඩු යවා ඇති කාලපරිච්ඡේදය සඳහා වැටුප් ගෙවිය යුතු බැවින් මෙම වියදම දරා ඇත.

(ආ) IX වන විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ද්වි වාර්ෂික සම්මන්ත්‍රණය අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් 2018 නොවැම්බර් මාසයේදී පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත්, රටේ පැවති වාතාවරණය හේතුවෙන් සැලසුම් කළ පරිදි සම්මන්ත්‍රණය නොපැවැත් වූ අතර 2019 වර්ෂයේදී මෙම සම්මන්ත්‍රණය පැවැත්වීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

(ඇ) 2018 වර්ෂයේදී සමාලෝචනය සඳහා වාර්තා ඉදිරිපත් කළ යුතු අනුමත ආයතන 06 ක් අතුරින් ආයතන 03 ක් ස්වයං තක්සේරු වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2018 වර්ෂයේදී සමාලෝචන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට අපට නොහැකි විය.

ජාතික විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මඟින් ලබා දී ඇති බලතලවලට අනුකූලව, ආයතන මඟින් දත්ත එක්රැස් කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ අරමුණ සහිතව නව කොමිෂන් සභාව විසින් ගැසට් නිවේදනයක් නිකුත් කිරීම සඳහා කටයුතු කරමින් ඇත.

**(ඇ) සහ (ඉ) සඳහා පිළිතුරු**

--------------------------------

2018 වර්ෂයේදී පිළියෙල කිරීම සඳහා සැලසුම් කරන ලද ප්‍රතිපත්ති වාර්තා තුන කෙටුම්පත් මට්ටම දක්වා සම්පූර්ණ කර ඇත.

විද්‍යා හා තාක්ෂණය පිළිබඳ IX වන ද්වි වාර්ෂික සම්මන්ත්‍රණය සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති 03 පිළියෙල කිරීම සඳහා සැලසුම් කර තිබූ අතර ඒ අනුව අදාළ විශේෂඥ මණ්ඩලය පවත්වන ලදී. කෙසේ වුවද, 2018 වර්ෂයේදී සම්මන්ත්‍රණය පැවැත්වීමට නොහැකි වීම හේතුවෙන් එම වර්ෂයේදී එම ප්‍රතිපත්ති සම්පූර්ණ කිරීමට නොහැකි විය.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් අප රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම සඳහා ඉතා කඩිනම් විය යුතු බව දැඩිව පිළිගන්නා අතර කොමිෂන් සභාව ඒ සඳහා ක්‍රියාත්මක වේ.

මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු

සභාපති